# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,724/2 — 1966 දෙසැම්බර් 3 වැනි සෙනසුරාදා — 1966 12 3

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

එල්. ඩී.—බී. 43/48 — අ. ආ. කා. අංකය : සී 292/65

### 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාව

#### 82 වන වගන්තිය යටතේවූ වාර්තාව

අංක 126 දරන වැලිමඩ මැතිවරණ දිස්ත්‍රික්කය සඳහා වැමුල්ලවත්තේ පර්සි සමරවීර තෝරා පත් කර ගැනීම ගැන පැමිණිලි කරන ඡන්ද පෙත්සම විභාග කළ මැතිවරණ විනිශ්චයකාරවරයා විසින් සකස් කරනු ලැබූ වාර්තාවෙහි පරිවර්තනයේ පිටපතක් 1961 අංක 72 දරන පනතින් සංශෝධිත (381 වැනි අධිකාරය වන) 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාවේ 82 ඈ (2) (අ) වන වගන්තියෙන් නියම කර ඇති පරිදි මෙහි පහත ප්‍රසිද්ධ කරනු ලැබේ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

නි. විජේවර්ධන,
අග්‍රාණ්ඩුකාරවරයාගේ ලේකම්.

1966 දෙසැම්බර් 3 වන දින,
කොළඹ දී ය.

### (381 වැනි අධිකාරය වන) 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාව

#### 82 වන වගන්තිය යටතේ වූ වාර්තාව

1965 මාර්තු 22 වන දින පවත්වනු ලැබූ මහා මැතිවරණයේ දී අංක 126 දරන වැලිමඩ මැතිවරණ දිස්ත්‍රික්කය සඳහා මන්ත්‍රීවරයකු තෝරා පත් කර ගැනීමෙහි ලා කිසිම අපේක්ෂකයකු විසින් හෝ ඔහුගේ දැනුම හා අනුමතිය ඇතිව කිසිම දූෂිත හෝ නීති විරෝධි කාර්යයක් සිදු වී ඇතැයි ඔප්පු වී නැති බව රාජසභා ආඥාවේ 82 වන වගන්තිය අනුව මම මෙයින් වාර්තා කරමි.

1965 නොවැම්බර් පළමුවන දින වූ මෙදින මගේ අත්සන යටතේ දෙන ලදී.

එච්. ඇන්. ජී. ප්‍රනාන්දු,
මැතිවරණ විනිශ්චයකාරවරයා,
1965 අංක 2 දරන ඡන්ද පෙත්සම.

---

ඇල්.ඩී.—බී. 43/48 — අ. ආ. කා. අංකය : සී. 292/65

### 1946 ලංකා පාර්ලිමේන්තු මැතිවරණ රාජසභා ආඥාව

#### 82 ඈ (1) (ආ) වන වගන්තිය යටතේ වූ දැන්වීම යි

අංක 126 දරන වැලිමඩ මැතිවරණ දිස්ත්‍රික්කය සඳහා මන්ත්‍රීවරයා වශයෙන් වැමුල්ලවත්තේ පර්සි සමරවීර මහත්මයා තෝරා පත් කර ගැනීම ගැන පැමිණිලි කරන ඡන්ද පෙත්සම විභාග කළ මැතිවරණ විනිශ්චයකාරවරයා විසින්, වැමුල්ලවත්තේ පර්සි සමරවීර මහත්මයා තෝරා පත් කර ගැනීම අවලංගු වූයේ යයි තමා විසින් විනිශ්චය කරන ලද බව (381 වැනි අධිකාරය වන) 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාවේ 81 වැනි වගන්තිය යටතේ සහතික කර ඇති හෙයින්, එකී රාජසභා ආඥාවෙහි 27 වන වගන්තිය සමඟ කියවිය යුතු 82 ඈ (1) (ආ) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර අග්‍රාණ්ඩුකාර විලියම් ගොපල්ලව වන මම, මේ දැන්වීමෙන්—

(1) ඉහත කී මැතිවරණ දිස්ත්‍රික්කයෙහි මැතිවරණයක් පවත්වන ලෙස අණ කරමි, තවද

(2) ඒ මැතිවරණය සඳහා අපේක්ෂකයන්ගේ නාම යෝජනා කිරීමේ දිනය වශයෙන් 1966 දෙසැම්බර් 30 වන දිනය ද, ස්ථානය වශයෙන් බදුල්ල කච්චේරිය ද නිශ්චිතව සඳහන් කරමි.

ඩබ්ලිව්. ගොපල්ලව,
අග්‍රාණ්ඩුකාරවරයා.

1966 දෙසැම්බර් 3 වැනි දින,
කොළඹ දී ය.

---


ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි

998/3——ආර්ආර් 19450—11,100 (66/12)